# රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව, කැගල්ල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 08 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව , රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූල ධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළයෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදල සඳහා ඉදිරියට ගෙවා තිබූ රු.31,865 ක් ගිණුම් වලින් අත්හැර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ඇප වශයෙන් නිලධාරීන් 28 දෙනෙකුගෙන් අයකර ගෙන තිබූ රු.118,292 ක ශේෂයක් ගිණුම් වලින් අත්හැර තිබුණි.

(ඇ) වර්ෂ කිහිපයක සිට නිරවුල් නොවී පවතින රු.18,981 ක අවිනිශ්චිත බැර ගිණුම් ශේෂයක් සමාලෝචිත වර්ෂයේ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂ ගණනාවක් තුල ණයහිමියන් 270 කට අදාලව ගෙවිය යුතුව තිබූ එකතුව රු.7,716,691 ක් වූ මුදල නිරවුල් කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් ගණුම්වල පොලී ආදායම බැංකු සහතික අනුව රු.131,867 ක් වුවද, ලෙජර් ගිණුම අනුව රු.285,712 ක් ලෙස රු.153,845 ක් වැඩියෙන් දක්වා තිබුණි.

( ර්) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ, ගිණුම අනුව රු.1,743,485 ක් වුවද, ලේඛන අනුව එහි වටිනාකම රු. 4,639,345 ක් වූයෙන් රු.2,895,860 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 15 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.56,299,941 ක් වූ අතර , උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.63,258,070 ක් විය.

1.3.3 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු 16,786,690 ක් විය.

1.3.4 <u>අනුකූල නොවීම්</u>

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ <u>තීරණ වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 (02) වගන්තිය | මාසයට අදාල රඳවා ගැනීමේ බදු මුදල් එම මාසය එක්කම එළඹෙන රළඟ මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කල යුතු වුවත් කොන්ත්‍රාත් යටතේ අවස්ථා 15 කට අදාල එකතුව රු.37,345 ක් වූ බදු මුදල් මාස 02 සිට මාස 10 දක්වා කාලයක් ප්‍රමාද කර ප්‍රේෂණය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය viii වැනි පරිච්ඡේදය 10 : 2 වගන්තිය | සති අන්තයේ හෝ රජයේ නිවාඩු දින සේවයේ යොදවා ගැනීමට පෙර ආයතන ප්‍රධානියා ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් එලෙස ලබා නොගෙන නිලධාරීන් සේවයේ යොදවා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මු.රෙ 71 | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ සේවකයින් 27 දෙනෙකු නිසි අනුමැතියකින් තොරව බඳවාගෙන සේවයේ යොදවා ගෙන තිබුණි. |
| (ii) | මු.රෙ. 371 (2) (ආ) | අවස්ථා දෙකකදී ලබාගත් රු.15,000 ක් වටිනා අතුරු අග්‍රිම අදාල මුදල් වර්ෂය තුළදී පියවා නොතිබු අතර,2001 වර්ෂයට පෙර ලබා දී ඇති රු.625,651 ක අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි. |
| (iii) | මු.රෙ. 371(2) (ඇ) | අවස්ථා 3 කදී ලබාගත් රු.15,800 ක තත්කාර්ය අත්තිකාරම් අදාල කාර්ය නිමකල වහාම පියවිය යුතු වුවත් දින 30 සිට දින 175 ක් දක්වා කාලයක් ප්‍රමාද කර පියවා තිබුණි. |
| (iv) | මු.රෙ.396 | සභාවේ බැංකු ගිණුමට අදාල 2010 දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව නිකුත් කල නමුත් වලංගු කාලය ඉක්මවූ රු.82,251 ක් වටිනා චෙක් පත් 19 ක් සම්බන්ධ යෙන් නියමයන් පරිදි කටයුතු කර නොතිබුණි. |
| (v) | මු.රෙ.570 (ඇ) | තැන්පත් කල දින සිට වර්ෂ 2 ත් 16ත් අතර කාලයක් ගතවූ රු.1,298,868 ක් වටිනා කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ.571 සහ 572 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 228,487 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,898,210 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද රුවන්වැල්ල මහජන බැංකුවේ අංක 81-1001-9287744 දරන බැංකු ගිණුමේ බැංකු සැසඳුමට අනුව තැන්පත් කරන ලද චෙක්පත් 6 ක වටිනාකම වූ රු.275,437 ක් සහ 2010 දෙසැම්බර් 31 දින " මුදලින් තැන්පත් කරන ලද" රු.299,457 ක් උපලබ්ධි නොවූ සේ සලකා මෙතෙක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද රුවන්වැල්ල මහජන බැංකුවේ අංක 81-1001- 4928780 දරන බැංකු ගිණුමේ බැංකු සැසඳුමට අනුව 2010 මැයි 07 දින වැරදි තැන්පත් ලෙස දක්වා තිබූ රු.53,960 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 |
| ( i) වරිපනම් හා බදු | 990 | 1,814 | 1,338 | 880 | 395 | 1,858 |
| ( ii) බදු කුලී | 9,227 | 8,184 | 759 | 6,960 | 5,090 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 294 | 343 | 80 | 186 | 148 | 161 |
| (iv) වෙනත් ආදායම් | 32,652 | 25,250 | 6,481 | 11,851 | 11,851 | 535 |

### 2.3.2. උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර්31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු 235,315 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි .

### 2.3.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.1,443,120 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත රු 000 | තථ්‍ය රු 000 | විචලනය රු 000 | අයවැයගත රු 000 | තථ්‍ය රු 000 | විචලනය රු 000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 26,719 | 23,390 | 3,329 | 23,358 | 22,944 | 414 |
| අනෙකුත් | 18,516 | 12,430 | 6,086 | 11,122 | 7,402 | 3,720 |
| උප එකතුව | 45,235 | 35,820 | 9,415 | 34,480 | 30,346 | 4,134 |
| පාග්ධන වියදම | 21,750 | 4,697 | 17,053 | 24,070 | 2,622 | 21,448 |
| මුළු එකතුව | 66,985 | 40,517 | 26,468 | 58,550 | 32,968 | 25,582 |

## 2.5 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතීයික | 25 | 24 |
| ප්‍රාථමික | 58 | 46 |
| වෙනත් ( අනියම්, ශ්‍රම පදනම මත) | - | 27 |

## 2.6 වත්කම් කළමණාකරණය

### 2.6.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

වටිනාකම තහවුරු නොවූ ට්‍රැක්ටර් 01 සහ කැබ් රථ 01 ක් නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

2.6.2 <u>ලැබිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.8,900,141 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.812,193 ක් විය.

2.6.3 <u>අයවීමට ඇති සේවක ණය</u>

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.8,474,542 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.115,057 ක් විය.

2.6.4 <u>අචල ජංගම වත්කම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම් වල අගය රු.1,993 ක් විය.

2.6.5 <u>සමීක්ෂණය නොකළ වත්කම්</u>

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු. 35,429,598 ක් විය.

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>මිලදී ගැනීම්</u>

භාණ්ඩ හා සේවා සැපයීම් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගෙන තිබියදී සමාලෝචිත වර්ෂය තුළදී රු.135,933 ක අගයකට වූ විදුලි පංකා, වතුර පිල්ටර්, ඩිජිටල් කැමරා ආදි භාණ්ඩ මිල කැඳවීම් නොකර සෘජු මිලදී ගැනීම් යටතේ රුවන්වැල්ල ස.ණ.ස. සමිතියෙන් මිලදී ගෙන තිබූ බව නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. තරඟකාරී මිල ගණන් යටතේ මිලදී නොගැනීමෙන් සභාවට මූල්‍යමය පාඩුවක් මෙන්ම තත්ත්වයෙන් හා ප්‍රමිතියෙන් උසස් භාණ්ඩ මිලට ගැනීමේ අවස්ථාවද ඇහිරී තිබුණි.

(ආ) <u>ගමන් වියදම් ගෙවීම</u>

සභාපතිවරයා මාසයකදී දින 22 සිට 25 දක්වා දින සංඛ්‍යාවක් සභා බල ප්‍රදේශයෙන් බැහැර රාජකාරි ගමන් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.65,500 ක සංයුක්ත දීමනා ලබාගෙන තිබුණි. මෙලෙස සභා බල ප්‍රදේශයෙන් බැහැර රාජකාරි කටයුතු වල නියැලීමෙන් සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු හා ජනතාවගේ අවශ්‍යතා සම්බන්ධව සොයා බැලීමට ඇති අවස්ථාව මගහැරී ඇති බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

2.8 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

<u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද</u>

පහත දැක්වෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට තිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය රු. | ආරම්භ කළ දිනය | නිමකිරීමට ඉලක්කගත දිනය | 2010 දෙසැම්බර් 31දිනට වියදම රු. | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|---|
| * | දොරණුව කැනඩා මිත්‍ර මාවතේ කොටසක් කොන්ක්‍රීට් කිරීම | 70,654 | 2009.11.30 | 2009.12.30 | - | කොන්ත්‍රාත් සමිතිය අසාධු ලේඛන ගත කර ඇත. |
| * | යටන්වල කන්ද පාර කොන්ක්‍රීට් කිරීම | 60,000 | 2009.12.13 | 2010.12.26 | - | ගිවිසුම අවලංගු කරන ලදී. |

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) සැපයුම් කළමනාකරණය

(ඇ) වත්කම් කළමනාකරණය